# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 71 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිල: ශත 90 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

## 1988 අංක 71 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 22/87

**1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 71 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ, 2 වන වගන්තියේ (ආ) ඡේදයෙහි "මහාධිකරණයේ පවරනු ලබන අද්මිරාල්ති නඩු කටයුතුවල දී හෝ" යන වචන වෙනුවට "මහාධිකරණයේ පවරනු ලබන අද්මිරාල්ති නඩු කටයුතුවල දී හෝ සිවිල් නඩු කටයුතුවල දී හෝ නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ වෙනත් යම් අධිකරණයක පවරනු ලබන සිවිල් නඩු කටයුතුවල දී හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1982 අංක 43 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙහි "යම් සාධන පත්‍රයකට" යන වචන වෙනුවට "යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට" යන වචන ආදේශ කිරීමෙන් සහ "යම් සාධන පත්‍රයක්" යන වචන වෙනුවට "යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (12) වන ඡේදයෙහි ඇති "ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ වාසියට ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්" යන වචන වෙනුවට "අනුමිත කළ ණය නියෝජ්‍යායතනයක් වෙත ණයවර ලිපියක් සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීමක්, ද්‍රව්‍යමය චංචල දේපළ සම්බන්ධයෙන් එවැනි යම් නියෝජ්‍යායතනයක වාසිය පිණිස වූ භාර කුවිතාන්සියක් හෝ භාර ලිපියක් හෝ භාර ප්‍රකාශයක් හෝ 24 වන වගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් යම් ගිවිසුමක් හැර, ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ වාසියට ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

2—D 001706—8,175 (88/10)

(ii) ඒ වගන්තියේ (14) වන ඡේදයේ (ඉ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඉඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ සලසනු ලැබූ නීති ආධාර ඇතිව නඩු පවරන, විත්තිවාචක ඉදිරිපත් කරන හෝ මැදිහත් වන යම් තැනැත්තකු බවට නියමිත නිලධරයකු විසින් සහතික කරනු ලැබූ තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන ;

(ඉඉඉ) මෝටර් වාහනයකින් සිදු වූ මරණයකින් හෝ හානියකින් උද්ගත වන අලාභ සඳහා හිමිකම් පාන යම් තැනැත්තකු විසින් හෝ වෙනුවෙන් යම් අධිකරණයක දී ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන ;" සහ

(iii) ඒ වගන්තියේ (21) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(22) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ විධි විධාන අනුව ලියා අත්සන් කරනු ලැබූ සාධන පත්‍රයක් ;".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇලෙන මුද්දර අවලංගු කිරීම.

7. (1) සාධන පත්‍රයකට ගෙවිය යුතු මුද්දර ගාස්තුව ගෙවීම ඇලෙන මුද්දරයක් මාර්ගයෙන් කළ යුතු යයි දන්වා ඇති අවස්ථාවක, ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා විසින් හෝ නොතාරිස්වරයකු විසින් ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, නොතාරිස්වරයා විසින් සහ ඒ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තා හෝ තැනැත්තන් ගෙන් කවර හෝ තැනැත්තකු විසින් මුද්දරය හරහා ඔහුගේ නම හෝ පිළිවෙළින් ඔවුන්ගේ නම් තීන්තෙන් ලිවීමෙන් සහ නම කෙටි අත්සන යෙදීමෙන් මුද්දරය නැවත වරක් පාවිච්චි කළ නොහැකි වන සේ එය අවලංගු කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් යථා පරිදි මුද්දර අලවා ඇති අවස්ථාවක, 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් තැනැත්තකු විසින් ඒ සාධන පත්‍රය මත අලවන ලද ඇලෙන මුද්දරය හරහා තීන්තෙන් නම නම ලිවීමෙන් සහ කෙටි අත්සන යෙදීමෙන් ඒ මුද්දරය නැවත පාවිච්චි කළ නොහැකි වන සේ අවලංගු කරනු ලැබිය යුතු ය.

(3) සාධන පත්‍රයක් රුපියල් පනහක හෝ වැඩි ගණනක වටිනාකම ඇති ඇලෙන මුද්දර යක් දරන අවස්ථාවක (1) වන හෝ (2) වන උපවගන්තියෙහි සඳහන් ලිවීමට අමතරව ඒ මුද්දරය කටුවකින්, ඡිද්‍රනයකින්, කපනයකින් හෝ නිපරයකින් කැපීමෙන් අවලංගු කරනු ලැබිය යුතු ය.

(4) (1) වන, (2) වන හෝ (3) වන උප වගන්තිවල දක්වා ඇති ආකාරයෙන් අවලංගු කරනු ලැබ නැති ඇලෙන මුද්දරයක් දරන යම් සාධන පත්‍රයක්, ඒ මුද්දරයේ වටිනාකමේ ප්‍රමාණයට මුද්දර අලවනු නොලැබූ ලෙස සැලකිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ "රුපියල් එකක මුද් දරයක්" යන වචන වෙනුවට "රුපියල් එකක වටිනාකම ඇති මුද්දරයක් හෝ මුද්දර" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන් තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (1) වන උප වගන්තියෙහි—

(අ) (ඉ) ඡේදයෙහි "මහාධිකරණයේ හෝ දිසා අධි කරණයේ නිලධරයකුට" යන වචන වෙනුවට "මහාධිකරණයේ, දිසා අධිකරණයේ හෝ නීති යෙන් ඇති කරන ලද හෝ පිහිටුවන ලද වෙනත් යම් අධිකරණයක නිලධරයකුට" යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ආ) "ආකෘති මත අණකරනු ලබන සහ නිකුත් කරනු ලබන චෙක්පත්" යන වචන ඇති සෑම තැනකම ඒ වචන වෙනුවට "චෙක් ආකෘති" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4අ) සමාගමින් විසින් නිකුත් කරන ලද කොටස් හෝ සෘණ ස්කන්ධ මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව, ගෙවීම සඳහා මේ වගන්තිය යටතේ එකතු කර ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ ඒ සමාගමේ ප්‍රධාන නිලධරයා විසින් ඒ කොටස් සහතිකය හෝ සෘණ සහතිකය මත ගෙවිය යුතු මුද්දර ගාස්තුවේ මුදල් ප්‍රමාණය සහ ඒ මුද්දර ගාස්තුව ගෙවීම සඳහා මේ වගන්තියට අනුකූලව එකතු කර ඇති බව, ඒ එක් එක් කොටස් සහතිකය හෝ සෘණ සහතිකය මත පිටසන් කරනු ලැබිය යුතුය.";

(iii) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි " මහාධිකරණය හෝ දිසා අධිකරණයක් " යන වචන වෙනුවට " මහාධිකරණය, දිසා අධිකරණයක් හෝ නීතියෙන් ඇතිකරන ලද හෝ පිහිටුවන ලද වෙනත් යම් අධිකරණයක් " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එහි (අ) ඡේදයේ " දිසා අධිකරණයක හෝ පවරනු ලැබූ යම් සිවිල් නඩු කටයුතුවල දී ; හෝ " යන වචන වෙනුවට " මහාධිකරණයේ හෝ දිසා අධිකරණයක හෝ නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ වෙනත් යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් නඩු කටයුතුවල දී ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ උපවගන්තියේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iiඅ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, බූදලයේ ශුද්ධ වටිනාකම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(4) පවරනු ලැබූ යම් දේපළක් සමාගමක කොටස්වලින් සමන්විත වන අවස්ථාවක පැවරීමේ සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකළ යුතු මුද්දර ගාස්තුව—

(අ) ඒ පැවරීම ත්‍යාගයක් මගින් වන අවස්ථාවක පැවරීමේ දිනයේ දී කොටස්වල වටිනාකම මත ;

(ආ) ඒ පැවරීම විකිණීමක් මගින් වන අවස්ථාවක විකිණීම සම්බන්ධයෙන් වූ අර්පණය පිළිගනු ලැබූ දිනයේ දී ඒ කොටස්වල වටිනාකම හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟ වූ මිල යන දෙකින් වැඩි මුදල් ප්‍රමාණය මත ගණන් බැලිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 15අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

(iii) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි " මහාධිකරණය හෝ දිසා අධිකරණයක් " යන වචන වෙනුවට " මහාධිකරණය, දිසා අධිකරණයක් හෝ නීතියෙන් ඇතිකරන ලද හෝ පිහිටුවන ලද වෙනත් යම් අධිකරණයක් " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(i) එහි (අ) ඡේදයේ " දිසා අධිකරණයක හෝ පවරනු ලැබූ යම් සිවිල් නඩු කටයුතුවල දී; හෝ " යන වචන වෙනුවට " මහාධිකරණයේ හෝ දිසා අධිකරණයක හෝ නීතියෙන් ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ වෙනත් යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් නඩු කටයුතුවල දී ; හෝ " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ උපවගන්තියේ (ii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iiඅ) මියගිය තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට, බූදලයේ ශුද්ධ වටිනාකම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(4) පවරනු ලැබූ යම් දේපළක් සමාගමක කොටස්වලින් සමන්විත වන අවස්ථාවක පැවරීමේ සාධන පත්‍රය සම්බන්ධයෙන් අයකළ යුතු මුද්දර ගාස්තුව—

(අ) ඒ පැවරීම ත්‍යාගයක් මගින් වන අවස්ථාවක පැවරීමේ දිනයේ දී කොටස්වල වටිනාකම මත ;

(ආ) ඒ පැවරීම විකිණීමක් මගින් වන අවස්ථාවක විකිණීම සම්බන්ධයෙන් වූ අර්පණය පිළිගනු ලැබූ දිනයේ දී ඒ කොටස්වල වටිනාකම හෝ පාර්ශ්වකරුවන් විසින් එකඟ වූ මිල යන දෙකින් වැඩි මුදල් ප්‍රමාණය මත ගණන් බැලිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 15අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

“ පරිවර්තනය කිරීම.

15අ. ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නොවන වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ප්‍රකාශිත යම් මුදලක් සම්බන්ධයෙන් යම් සාධන පත්‍රයකට මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු අවස්ථාවක සාධන පත්‍රයේ දාතමයේ දිනයෙහි පවත්නා විනිමය අනුප්‍රමාණයට අනුකූලව ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ඒ මුදලේ වටිනාකම මත ඒ ගාස්තුව ආගණනය කරනු ලැබිය යුතු ය. නැතහොත් සාධන පත්‍රය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියන ලද හෝ සාදන ලද විනිමය බිල්පතක්, චෙක්පතක් හෝ පොරොන්දු නෝට්ටුවක් වන අවස්ථාවක ඒ සාධන පත්‍රය ශ්‍රී ලංකාවේ දී මුද්දර අලවනු ලැබූ දින ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් ඒ මුදලේ වටිනාකම මත ඒ ගාස්තුව ආගණනය කරනු ලැබිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “ දේපළ සමර්පනය කිරීමක දී ” යන වචන වෙනුවට “ චංචල දේපළ සමර්පනය කිරීමක දී ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(ඉඉ) ආණ්ඩුව විසින් ගෙවීම කරනු ලැබීම මත යම් සේවාවන් සැලසීම සඳහා හෝ (විදුලි බල ශක්තිය ඇතුළුව) යම් බඩු සැපයීම සඳහා හෝ ආණ්ඩුව සමග හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුවේ වාසියට හෝ ඇතුළත් වූ ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට, ආණ්ඩුව සමග ඒ ගිවිසුමට ඇතුළත් වන පාර්ශ්වය විසින්.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ (ආ) ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව රුපියල් පන්දහසක් හෝ ඊට අඩු ගණනක් නම්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ යම් නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු විසින් හෝ තත් කාර්යය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් බලය දෙනු ලැබූ යම් සහකාර රෙජිස්ට්‍රාර්වරයකු විසින් හෝ ඒ සාධන පත්‍රය අනුව ක්‍රියා කරනු ලැබීම

කළ හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (1) වන උප වගන්තියේ “ රුපියල් පනහක ගාස්තුවක් ” යන වචන වෙනුවට “ රුපියල් දෙසිය පනහක ගාස්තුවක් ” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) 30(1) (ආ) වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ යම් දැන්වීමක් මගින් ගෙවන ලෙස නියම කර ඇති ගාස්තුව ඒ දැන්වීමෙහි සඳහන් වන දින දී හෝ ඉන් පෙර හෝ ගෙවිය යුතු ය. තවද, ඒ ගාස්තුව එසේ සඳහන් දින දී හෝ ඉන් පෙර හෝ නොගෙවනු ලබන අවස්ථාවක, නොගෙවා ඇති සෑම මාසයක් සඳහා ඒ ගාස්තුවෙන් සියයට දහය කට සමාන දණ්ඩනයක් සමග ඒ ගාස්තුව පැහැර හරිනු ලැබූවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ගාස්තුව ගෙවිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා මේ පනතේ කාර්යය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද දණ්ඩනය වශයෙන් ගෙවිය යුතු මුළු මුදල පැහැර හරිනු ලැබූ ගාස්තුවෙන් සියයට පනහක් නොඉක්ම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 56අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

**"ව්‍යාජ මුද්දර භාවිතය.**

56අ. නීත්‍යානුකූල බලය නොමැතිව යම් මුද්දරයක් හෝ අච්චුවක් සාදන හෝ නිපදවන තැනැත්තෙක් සෑදීමෙහි ලා හෝ නිපදවීමෙහි ලා කවර හෝ ආකාරයකින් සහාය දෙන තැනැත්තෙක් එසේ සාදනු ලැබූ හෝ නිපදවනු ලැබූ යම් අච්චු කිසිවක් හෝ යම් මුද්දරයක් තම සන්තකයෙහි ඇතිව සිටින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 59අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 59 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

**"64 අ වගන්තිය යටතේ දැන්වීමට අනුකූලව කටයුතු නොකිරීම.**

59අ. 53 වන වගන්තිය හෝ 64අ වගන්තිය යටතේ තමා වෙත දෙන ලද දැන්වීමක නියමයන් අනුව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.".

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 64අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 64 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

**"තොරතුරු ලබාගැනීමට ඇති බලය.**

64අ. (1) (i) දැන්වීමෙහි සඳහන් කරනු ලබන යම් ලේඛනයක් හෝ සාධක පත්‍රයක් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව ඇතුළත පරීක්ෂා කිරීම සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලෙස හෝ එවන ලෙස ;

(ii) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් තොරතුරක් සපයන ලෙස ;

(iii) දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කරුණු කිසිවක් පිළිබඳව තමාගෙන් කරුණු විභාග කළ හැකි පරිදි දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් ස්ථානයක සහ යම් දිනයක සහ යම් වේලාවක පෞද්ගලිකව හෝ බලය දෙන ලද නියෝජිතයකු මගින් හෝ පෙනී සිටින ලෙස

මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකුට නියම කරමින් එම තැනැත්තා වෙත කොමසාරිස් ජනරාල්වරයා හෝ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයා හෝ තක්සේරුකරුවකු හෝ විසින් ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය හැකි ය.

(2) යම් තොරතුරක් සැපයීමට යම් තැනැත්තකුට නියම කරමින් (1) වන උපවගන්තිය යටතේ ඒ තැනැත්තාට දැන්වීමක් දෙනු ලැබ ඇති අවස්ථාවක, ඒ තොරතුරු සැපයීම තහනම් කරමින් වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද ඒ තැනැත්තා විසින් ඒ නියමය අනුව කටයුතු කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දෙන ලද දැන්වීමක් අනුව පෙනී සිටින යම් තැනැත්තකුට එසේ පෙනී සිටීමෙහි ලා ඔහු විසින් සාධාරණ ලෙස දරන ලද වියදම් කොමසාරිස් ජනරාල්වරයා විසින් දෙනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ "තැනැත්තා" යන්නෙහි බැංකුකරුවකු ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "ලේඛනය" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"ලේඛනය" යන්න යම් අධිකරණයක නඩුවක් සම්බන්ධයෙන යෙදෙන විට නීතිඥවරයකු පත් කිරීම, පැමිණිල්ල, උත්තරය, ප්‍රතිඋත්තර හෝ වෙනත් උත්තරවාදයක්, පෙත්සමක්, ඉල්ලීමක්, දිවුරුම් පත්‍රයක්, පත් කිරීමක්, සිතාසියක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක්, කවර හෝ ආකාරයක නියමයක්, ප්‍රදානයක්, රිට් ආඥාවක්, වරෙන්තුවක් ඉන්වෙන්ටරියක්, ගිණුමක්, අධිකරණ විධානයක්, බැඳුම්කරයක්, ඇපකරයක්, කැඳවීම් නියෝගයක්, මෝසමක් නොවන ඉල්ලීමක්, විචාරණ, විචාරණවලට උත්තරයක්, අභියාචන දැන්වීමක්, ගාස්තු බිල්පත්‍ර, අධිකාර පත්‍රයක්, ඉන්ජන්ෂන් තහනමක් හෝ දැන්වීමක් අදහස් වේ.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.